වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන

--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව පිළිවෙලින් රු.22,555,483 ක් හා රු.938,445 ක්වූ සභාවට අයිති නැති දේපළ හතලිස් හතක සහ වාහන දෙකක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දේපළ හා වාහන වටිනාකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී රු.36,983,745 පිරිවැයකින් ඉදිකරන ලද සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම රු. 25,727,986 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.11,255,759 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී නිමකළ ඉදිකිරීමේ කර්මාන්ත කොන්ත්‍රාත් 05ක් වෙනුවෙන් වූ එකතුව රු.47,015 ක අතිරික්ත ප්‍රතිපාදන සමුච්චිත අරමුදලට බැර නොකර, පසුගිය වසර 02 ක් පුරාම විවිධ ණයගැති ගිණුමේ දක්වා තිබූ බැවින් , සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල රු.47,015 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා සවිබල ගැන්වීමේ ජාතික වැඩ යෝජනා ක්‍රමය අනුව, 2015 හා 2016 වර්ෂවල නිමකළ එකතුව රු.2,231,150 ක්වූ සංවර්ධන වැඩ 11 ක් සඳහා සභා අරමුදලින් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට ගෙවීම් කර තිබුණි.
කෙසේවෙතත්, අදාළ අමාත්‍යාංශයෙන් විධිමත් පරිදි අරමුදල් ලබාගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග නොගෙන පසුගිය වසර 01 සිට වරස 02 ක කාල පරිච්ඡේදය තිස්සේ එය සභා අරමුදලින් ගෙවන ලද අත්තිකාරමක් ලෙස දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

නිමකළ කොන්ත්‍රාත් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවිය යුතු එකතුව රු.743,872 ක මුදලක් ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.3.4 අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | 4,420,482 | දේපළ මත හිඟ තක්සේරු බදු ගෙවීම් පැහැරහැරි පුද්ගලයන්ට සහා ලේකම් විසින් වරෙන්තුවක් නිකුත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | 1,229,064 | සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව, පසුගිය වර්ෂ 02 සිට වර්ෂ 04 තිස්සේ කල් ඉකුත් තැන්පතු 49 ක් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| (ඇ) | 2008 ජුනි 26 දිනැති අංක13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | වාහන නවයක දෛනික ධාවන සටහන් පසුව එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 | | නිලධාරීන් තිදෙනෙකුගෙන් සභාව ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,785,467 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,045,949 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 2,186,955 | 78,095,303 | 2,760,298 | 5,338,480 | 2,570,965 | 403,506 | 2,234,827 | 4,803,580 |
| (ii) කුලී | 12,719,392 | - | 10,924,286 | 22,472 | 13,271,144 | - | 10,669,006 | 19,197 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,820,000 | - | 1,882,427 | 15,500 | 1,816,000 | - | 1,654,520 | 43,000 |
| (iv)වෙනත් ආදායම් | 19,253,000 | - | 26,620,190 | 69,474,678 | 15,963,500 | - | 22,322,954 | 66,404,728 |
| එකතුව | 35,979,347 | | 41,987,201 | 774,851,130 | 33,621,609 | 403,506 | 36,872,307 | 71,270,505 |

### 2.2.2 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම් බදු

රු.4,420,482 ක්වූ දේපළ මත හිඟ තක්සේරු බදු අයකර ගැනීම සඳහා වසර 01 සිට වසර 21 දක්වා කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ජල බදු

එකතුව රු.210,535 ක් වූ හිඟ ජල බදු අයකර ගැනීම සඳහා වසර 01 සිට වසර 13 දක්වා කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

රු.876,691 ක් වූ උසාවි දඩ මුදල් සහ රු.218,612 ක්වූ මුද්දර ගාස්තු උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් 2017 දෙසැම්බර් 31 දිනට දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අතහැර දැමූ කාර්යයන්

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. 2011 වර්ෂයේදී රුපියල් මිලියන 35.21 පිරිවැයකින් ඉදිකරන ලද බහු කාර්ය ශාලාවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන කටයුතු අත්හැර දමා තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයට අනුව, සභාව විසින් ක්‍රියාත්මක කිරීමට තිබූ එකතුව රුපියල් මිලියන 49.9 ක්වූ ප්‍රාග්ධන වැඩ යෝජනා ක්‍රම දහසයක් මුළුමනින්ම අත්හැර දමා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. දෛනික කසළ එකතු කිරීම් කැබලි කර පස්වලින් වසා නොතිබුණි.

ii. මදුරුවන් හා කීටයන් පැතිරීම වැළැක්වීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා මදුරු තෙල් ඉසීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

iii. ජාතික ප්‍රතිපත්ති අනුව වෙන් කිරීම් නොකර ඝන අපද්‍රව්‍ය පුළුස්සා තිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

සභාව විධිමත් පරිදි මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 07 ක් විසින් නිමකළ යතු කාර්යයන් පමාවී තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

---------------------------------

3.3.1 වත්කම් භාරදීමට අසමත්වීම

--------------------------------

සභාව විසින් භාවිතා කරණ වාහන හයක් සභාවට අයත්ව නොතිබුණි.

3.3.2 අක්‍රිය වත්කම්

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.884,992 ක් පිරිවැයකින් ඉදිකරන ලද පොන්නලායි ග්‍රාමීය වෙළඳ පොළ ප්‍රයෝජනයට ගැනීම සඳහා පසුගිය වසර දෙකක් තිස්සේ සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් වාහන දෙකක්, සාතකාගාරයක් සහ පෙර පැවති ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ආදිය පසුගිය වසර 02 සිට වසර 15 දක්වා කාලය තුළ අක්‍රියව පැවතුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

-------------------------------------

අයවැය පාලනය

------------------

අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.62,427 සිට රු.5,044,754 හෙවත් සියයට 03 සිට සියයට 10 දක්වා ද අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.48,873 සිට රු.6,008,323 හෙවත් සියයට 06 සිට සියයට 12 දක්වා ද වූ පරාසයන් තුළ විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | පාඩු ලේඛනය, වීථි ලාම්පු ලේඛනය, මිණුම් පත්‍රිකා ලේඛනය, ඉඩම් විකිණීම් මත බදු ලේඛනය සහ සේවක ඇප තැන්පතු ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |